# සමාජ සංස්කෘතික වෙනස් වීම පුද්ගල පෞරුෂයට සිදු කරන බලපෑම පිළිබඳ විතැන් වූ වැදි ජනතාව ආශ්‍රයෙන් කළ විශ්ලේෂණයක්

මධුක හිත්තැටියගේ, කේ. කේ. ඩිලාන් තිසරු හේවාමාන්න
එම්. ඩී. බී. විහාරා සෙව්වන්දි, සේපාල සමරසේකර*
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sepalasamarasekara@gmail.com

ශ්‍රී ලංකාවේ වැදි ජනතාව යනු ස්වකීය සංස්කෘතිය තුළින් ගොඩනැගුණු ඔවුන්ට ආවේණික වූ පෞරුෂයකට හිමිකම් කියන පිරිසකි. පොල්ලෙබැද්ද යනු දානිගල වැදි ගම්මානයේ සිට විවිධ හේතූන් නිසා ගෙනැවිත් රජය මඟින් ස්ථාපිත කළ ජනපදයකි. එමගින් සිදුවූ වෙනස්වීම හා එහි ප්‍රතිවිපාක විමසීම මෙහි ප්‍රධාන අරමුණයි. එයට අමතරව සමාජ සන්නිවේදන, දේශපාලන අංශවල ඇති වූ වෙනස්වීම් ද එයට බලපෑ හේතූන් හා එමඟින් වැදි ජනතාවගේ ජීවන රටාවට අහිතකර බලපෑම් කරනු ලැබුවේ නම් ඒ සඳහා කළ යුතු වෙනස්කම් හඳුන්වා දීම ද මෙහි අවශේෂ අරමුණකි. පොල්ලෙබැද්ද වැදි ගම්මානයේ පවුල් 120 ක් සිටින අතර ඉන් අහඹු ලෙස තෝරා ගත් පවුල් ඒකක 25ක් ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදුකරන ලදී. එම පවුල් මඟින් තොරතුරු ලබා ගන්නට සම්මුඛ සාකච්ඡා උප ලේඛනයක් යොදා ගැනුණි. දත්ත විශ්ලේෂණයේදී හඳුනාගන්නට හැකි වූයේ පොල්ලෙබැද්ද වැදි ගම්මානයේ පවුල් අතරින් එක් අයෙකු හෝ විදේශගත ව ඇති පවුල්, සමස්ත පවුල් සංඛ්‍යාවෙන් 20%ක් වූ බවයි. පවුලකින් එක් අයෙකු හෝ (පිරිමි) නගරාශ්‍රිත ව කම්කරු වැනි වෘත්තීන්හි යෙදෙන පවුල් 28%ක් වූ අතර ඇඟලුම් කම්හල් වල සේවයේ නියුතු කාන්තාවන් සිටින පවුල් ප්‍රමාණය නියැදියෙන් 12%ක් විය. ඒ හැරුණු විට සාම්ප්‍රදායික ජීවනෝපාය ක්‍රම ආශ්‍රයෙන් ජීවත් වන පවුල් ගණන මුලු නියැදියෙන් 20%කි. ගොවිතැන හා කම්කරු වෘත්තිය ජීවනෝපාය කර ගන්නා පවුල් ගණන මුලු නියැදියෙන් 20%ක් විය. එම විතැන්වීම ජනතාව ගැටළු රාශියකට මුහුණ දීඇත. පාරම්පරික වාසභූමි අහිමි වීම, චාරිත්‍ර වාරිත්‍ර ඒ අයුරින්ම පවත්වාගෙන යාමට නොහැකි වීම හා ජීවන රටාවේ වෙනස් වීම නිසා සංස්කෘතිය වෙනස්වීම ඉන් කිහිපයකි. එමෙන්ම පවුල්වල සාමාජිකයන් ප්‍රමාණය ඉහළ යන විට ඉඩම් බෙදීයාමත්, සහනාධාර මත ම යැපීමට උත්සාහ කිරීමත්, මූල්‍ය කළමනාකරණය පිළිබඳ නොදැනුවත්කමත් හඳුනාගත හැකිය. නූතන සන්නිවේදන මාධ්‍යයන් පිළිබඳ අනවබෝධයත් මේ නිසා ඔවුන්ගේ පෞරුෂය තුළ සිදු වූ වෙනස්කම් රැසකි. තරුණ හා වැඩිහිටි ප්‍රජාව අතර පෞරුෂයේ ඇතිවූ විවිධ වෙනස්කම් අතර කාංසාව, හීනමානය වැනි මනෝභාවයන් ඇතිවීමත් මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමත් අන්‍යයන් මත යැපීමට උත්සාහ කිරීමත් හඳුනාගත හැකිය. මේ තත්ත්වන් සඳහා විසඳුම් ලෙස මෙම ජනතාව නව රැකියා සඳහා යොමු කිරීම, වෘත්තීය අධ්‍යාපනය ලබාදීම, මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපදේශනය, ප්‍රාදේශීය සම්පත් ආශ්‍රයෙන් කුඩා කර්මාන්ත ඇති කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ආදිය යෝජනා කෙරේ. ඒ අනුව පෙනී යන කරුණක් නම් පුද්ගල පෞරුෂයේ විවිධ වෙනස්කම් හා අර්බුද උද්ගත වීම සඳහා සමාජ සංස්කෘතික වෙනස් වීම සෘජුව ම බලපාන බවය.

**ප්‍රමුඛ පදඃ** වැදි ජනතාව; සංස්කෘතිය; පෞරුෂය; වෙනස්වීම.